# යෝගාචාර විඥානවාදි දර්ශනය තුළ 'මනස' පිළිබඳ දක්වා ඇති විග්‍රහය විඥප්තිමාත්‍රතාසිද්ධිය ඇසුරින් අධ්‍යයනයක්

ඩබ්. එම්. චතුර ගිම්හාන[1]

## හැඳින්වීම

බුදුදහම වනාහි පුද්ගල මනස කෙරෙහි අභිප්‍රේරිත මනෝමූලික දහමකි. බුද්ධ දේශනාව වැඩිමනත්ම මනස පිළිබඳ ඉගැන්වීම්වලින්ම සුපෝෂිත වීම ඊට හේතුවයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මයත්, පනවන ලද විනයත් ගුරු තැන්හිලා තබාගෙන මහ තෙරවරුන් කටයුතු කළ අතර කාලානුරූපීව ඇති වූ ශාසන විලෝපකාරී ක්‍රියා, ගැටලුකාරී තත්ත්වයන් ආදිය මත භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී ගොස් මුල් බුද්ධ දේශනාවන් පදනම් කොටගෙන ඒවාට නිවැරදි අර්ථකථන ආදිය සපයන්නට විය. මෙකී හේතු මත බෞද්ධ සම්ප්‍රදායන් බොහෝමයක් බිහි විය. අර්ථකථන සැපයීම හේතුවෙන් සහ අන්‍ය බෞද්ධ සම්ප්‍රදායන්හි ධර්ම ප්‍රවිචය විග්‍රහයන්ට ප්‍රතිචාර දැක්වීම යන හේතුන් මත පදනම්ව මහායාන නිකායෙන් ක්‍රි.ව. පළමු සියවසේ බිහි වූ වැදගත් බෞද්ධ සම්ප්‍රදායකි, යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය. එවක භාරතය තුළ වාසය කළ අග්‍රගණ්‍ය බෞද්ධ ආචාර්යවරුන් වූ මෛත්‍රෙයනාථ, අසංග, වසුබන්ධු වැනි තෙරවරුන්ගේ සහයෝගයෙන් ගොඩනැගුණු සහ විකාශය වුණු මෙම සම්ප්‍රදාය විශාල ධර්ම සාහිත්‍යයක්ද බෞද්ධ ලෝකයට දායක කොට ඇත. ඒවා මගින් මනස පිළිබඳව ඔවුන්ගේ අර්ථ විවරණයන් ඉස්මතු කොට ගැනීමට ද පහසුය. එහි විශේෂත්වය නම් මනස පිළිබඳව ඉන් පැනෙන දාර්ශනික විග්‍රහයන්ය. ඒ අතුරින් ආචාර්ය වසුබන්ධු පාදයන් වහන්සේ විසින් සම්පාදිත විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයට මූලිකත්වයක් හිමිවනුයේ එතුළින් සම්ප්‍රදානුයාත මූලික ඉගැන්වීම් මොනවාද සහ ඉන් ගම්‍යමාන වන අර්ථයන් ඉස්මතු කොට ගැනීමට හැකිවීමයි. එහි එන යෝගාචාර චින්තාවේ ඉගැන්වීම් මගින් මනස සම්බන්ධව දක්වා ඇති විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක නිරතවීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. වසුබන්ධු තෙරුන්ගේ විඥප්තිමාත්‍රතාසිද්ධි වාදය තුළින් විඥානවාදය යනු කුමක් ද යන්නත්, මනස පිළිබඳ දක්වා ඇති විග්‍රහය කෙබඳු ද යන්නත් අධ්‍යයනය කළ හැක. මෙම අධ්‍යයනය මූලික වශයෙන් විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි අන්තර්ගත "විංශතිකා'' සහ ''ත්‍රිංශතිකා'' යන කාරිකාවන්ට පමණක් සීමා කරනු ලැබේ. විඥානය ''සත්'' විඥෙයය ''අසත්'' යන මූලිකාංග හරහා බාහිර ලෝකයේ පවත්නා මානසික නිර්මිතත්වය මනාව ඉස්මතු කොට ඇත. එය මුල් වනුයේ විඥානය යි. එබැවින් විෂය ලෝකය සිතිවිලි මාත්‍රතාවක් මිස සැබවින්ම පවතින්නක් නොවන බවත් විෂයීක ධර්ම හෙවත් මනස ''සත්'' යන විග්‍රහය මෙමගින් ප්‍රධාන ලෙස දක්වයි. එවැනි ඉගැන්වීමක් මගින් 'මනසක් පමණක් ඇත' යන අදහසක් ඉස්මතු වේදැ'යි යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුව වන අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මේ සඳහා භාවිත කර ඇත. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය ඇසුරින් දත්ත රැස් කර ගන්නා ලදී. එම

1 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය, ශ්‍රී ලංකාව.
chathuraweerasinghe275@gmail.com

පදනම මත යෝගාචාර විඥානවාදී දර්ශනය තුළ 'මනස' පිළිබඳ දක්වා ඇති විග්‍රහය විඥප්තිමාත්‍රතාසිද්ධිය ඇසුරින් අධ්‍යයනය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

**පර්යේෂණ අරමුණු**

යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය තුළ මනස පිළිබඳ විග්‍රහය අධ්‍යනය කිරීමත්, විඥප්තිමාත්‍රතාසිද්ධිය ඇසුරින් "මනසක් පමණක් පවතී'' යන අදහස ඉස්මතු වන්නේද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කෙරෙන මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් විඥප්තිමාත්‍රතාසිද්ධිය භාවිතා කරනු ලබන අතර, ද්විතියික මූලාශ්‍රය ලෙස ඒ හා සම්බන්ධ විෂය පථයට අයත් රචිත ග්‍රන්ථ, ලිපි ලේඛන සහ විද්වත් මතවාද යොදා ගනු ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මූලාශ්‍රයානුයාත දත්ත විශ්ලේෂණයේ දී ආනුභවික බාහිර ලෝකය චිත්ත මාත්‍රතාවක් හෙවත් මනස තුළ උපදවා ගත් සංකල්පයකි. එමෙන්ම පරමාර්ථ වූ බාහිර ලොවක් ද නැති අතර "සත්'' වූ විඥානය ද විපරිණාමයට පත්වෙමින් ගලා යන දිය පහරක් සේ වෙනස් වෙමින් සසර තුළ පවතින්නක් බැවින් විඥානය ද ස්ථිර වශයෙන් නොපවතින බව අනාවරණය විය. මනස හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව ගැඹුරු සහ දාර්ශනික අධ්‍යයනයන්ට විඥප්තිමාත්‍රතාසිද්ධිය උපයෝගී වන බව මෙයින් අවබෝධ කරගත හැක. එමෙන්ම මනසෙහි සියුම් බව හා ව්‍යවහාර ලෝකයේ මනස සම්බන්ධ විග්‍රහයට එහා යමින් විෂය, විෂයීක ධර්මයන්ගේ පවත්නා යථාර්ථය ද මෙමගින් පැහැදිලි වේ. මනස සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීමටත්, අධ්‍යයනය කිරීමටත් විඥප්තිමාත්‍රතාසිද්ධිය ශාස්ත්‍රීය බෞද්ධ ලෝකයට ඉතා වැදගත් බවද මින් අවධාරණය වන්නකි.

**විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයෙහි එන ඉගැන්වීම් මනස පිළිබඳව දක්වන විග්‍රහය**

දිගුකාලීන බෞද්ධ චින්තාවේ පශ්චාත්කාලීන සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස මහායාන නිකාය තුළ ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසේ පමණ යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය බිහි විය. භදන්ත අසංග හිමියන් ප්‍රධාන දාර්ශනික බෞද්ධ ලෝකයේ පඬිවරු වූ වසුබන්ධු වැනි තෙරවරුන් සමකාලීන බෞද්ධ චින්තාවට ආවශ්‍යකයක්ව පැවති සහ මුල් බුදුසමයේ හා නිකායාන්තර බුදුසමයේ වෙසෙසින් දැක්වෙන මනස පිළිබඳ විග්‍රහයට තර්කානුකූල හා බුද්ධිමය ප්‍රතිචාර දැක්වීම මත යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය සංවර්ධනය විය. චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායන්හි හීනයානයෙන් හා මහායානයෙන් සම්භවය වූ වෛභාෂික හා සෞත්‍රාන්තික මෙන්ම මාධ්‍යමික සම්ප්‍රදායත් ආනුභවික සත්ත්වයා හා විෂයී ලෝකය ප්‍රධාන විෂය, විෂයී ධර්මයන් පිළිබඳ දක්වා තිබූ විග්‍රහයන්ට අපක්ෂපාතී, නිවැරදි හා තර්කානුකූල අයුරින් ධර්ම ප්‍රවචනය ඉදිරිපත් කිරීම සිදුකොට ඇත. කාලත්‍රයේ සියලුම ධර්මයන් "සත්'' යන වෛභාෂික මතයත්, සියලු ධර්මයන්

සමනන්තරව ක්ෂණයෙන් ක්ෂණය ක්‍රියාත්මක වේය යන සෞත්‍රාන්තිකයන්ගේ ක්ෂණවාදයට මෙන්ම සියලුම ධර්මයන් ශූන්‍යය, සාපේක්ෂකය යන විග්‍රහයන්ට නොගොස් විඥානය හෙවත් විෂයික ධර්ම "සත්'' ය විඥෙය්‍යය හෙවත් විෂය ලෝකය "අසත්'' ය, එය වනාහි සිතිවිලි මාත්‍රයක් හෙවත් මනස කේන්ද්‍ර කොට ගෙන නිර්මාණය වූවක් ය, යන විග්‍රහය විඥානවාදී යෝගාචාර සම්ප්‍රදාය ඉදිරිපත් කළහ.

යෝගාචාර දර්ශනයේ සිද්ධාන්ත කථනය සඳහා යොදාගත හැකි ප්‍රාමාණික මූලාශ්‍රයක් ලෙස විඥප්තිමාත්‍රතාසිද්ධිය හඳුනාගත හැක. වසුබන්ධු ආචාර්යන් වහන්සේ විසින් රචිත මෙම කෘතිය මගින් විඥානවාදය යනු කුමක්ද? ඉන් ගම්‍යවන අදහස් මොනවාද? මනසක් පමණක් ඇත්තේ ද? ආදී කොටගත් නොයෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයාගත හැක. මෙය කොටස් දෙකකින් සමන්විත වන අතර පළමුවැන්න විංශතිකා කාරිකාවයි. දෙවැන්න ත්‍රිංශතිකා කාරිකාවයි. මේවා පිළිවෙලින් ශ්ලෝක 22න් සහ 30න් යුක්ත වන අතර ඊට ලියැවුණු භාෂ්‍යයන්ද දැක් වේ. විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය යනුවෙන් මෙය හඳුන්වනුයේ ද වාදයක් ආකාරයෙන් ප්‍රශ්න සහ පිළිතුරු සැපයීමක් තිබෙන බැවිනි. විංශතිකා කාරිකාව චිත්තමාත්‍රතාව පිළිබඳව දක්වා ඇති අතර ත්‍රිංශතිකා කාරිකාව විඥාන පරිණාමය ආශ්‍රයෙන් විඥානයේ ස්වභාවයද දක්වා ඇත. මෙම කරුණු මත පදනම්ව උක්ත ප්‍රස්තුතය පිළිබඳව විමසීම මෙහිදී සිදු කරනු ලබයි.

විංශතිකා කාරිකාවෙහි පළමු ශ්ලෝකය මෙහිදී මූලිකව විමසා බැලිය හැකිය.

'විඥප්තිමාත්‍ර මේවෙත - දසදාර්ථාව භාසනාත්

යථා තෛමිරිකස්‍යාසත් - කේශචන්ද්‍රාදිදර්ශනම්.'

නැති වස්තුවක් ඇති ලෙස වැටහීම නිසා මෙය හැඟීම් මාත්‍රයකි. ඇසෙහි තිමිර පටලය සෑදුණු පුද්ගලයෙකුට පෙනීමෙහි වරද නිසා හිසකෙස්, සඳමඬල ආදී නැති වස්තුවක් ඇති ලෙස පෙනෙන්නාක් මෙනි.

මේ අනුව ලොව පවත්නා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ වන්නා වූ සෑම දෙයක්ම විඥප්තිමාත්‍රයක් පමණි. සත්ව, පුද්ගල, ස්කන්ධ, ආයතන, ධාතු යන මේ සියල්ලම වනාහි සිතුවිලි මාත්‍රයකි, විඥප්තියකි. ඒ ප්‍රකාරව බාහිර ලෝකය සැබැවින් පවතින්නක් නොවේ. සිතින් නිර්මාණය කරන ලද්දකි. නමුත් මෙලෙස නැති වස්තුවක් ඇති ලෙස වටහා ගනුයේ දෙවැදෑරුම් ආවරණයක් හේතුවෙනි. එනම් ආත්මාවරණය සහ ධර්මාවරණයයි. ආත්මයක් පවතින්නේය සහ සත්වයෙක් පුද්ගලයෙක් නැත, ඇත්තේ ස්කන්ධාදී ධර්මයන් පමණි යන මතයන් හරහා එය සිදු වේ. මේ පිළිගැනීම් ද්විත්වයම සාවද්‍යය. මෙම ආත්ම, ධර්ම ව්‍යවහාරය විඥප්තිමාත්‍රතාවට අනුව හුදෙක් උපචාර වශයෙන් හෙවත් ඒ ඒ තැනට ගැලපෙන පරිද්දෙන් යෙදෙන්නක් පමණි. එය විඥානයේ පරිණාමයක් මිස සත්‍ය වශයෙන් පවතින්නක් නොවේ. ත්‍රිංශතිකා කාරිකාවෙහි ඒ බව දැක්වෙනුයේ පහත පරිදිය.

'ආත්ම ධර්මෝපචාරෝ හි - විවිධෝ යඃ ප්‍රවර්තතේ

විඥානපරිණාමෙ සෞ - පරිණාමඃ ස ච ත්‍රිධා'

මෙම සත්ව, පුද්ගල, ස්කන්ධ ආදිය හැඟීම් පමණකි. ඒවායේ කිසිදු සත් ස්වභාවයක් නොමැත. නියමාකාරව අවබෝධ කරගත හොත් කෙලෙසුන් නැසීම තුළින් බුද්ධත්වය කරා ළඟාවිය හැකිය. ඒ හේතුවෙන්ම මෙය අචින්ත්‍ය ස්වභාවයෙන් යුතු බුදුරදුන්ට පමණක්ම ගෝචර වන්නක් ලෙසද විංශතිකා කාරිකාවෙහි දැක්වේ. *'කෘතෙයං සර්වථා සා තු - නචින්ත්‍යා බුද්ධගොචරඃ'*

සියල්ල මායාවකින් යුත් සිතිවිලි මාත්‍රයකි යන්න වටහා ගැනීම අපහසු බව මින් ගම්‍ය වේ. මෙතෙක් දැක්වූ කරුණු මගින් පැහැදිලි වන්නේ 'සියල්ල ඇත' යන සර්වාස්තිවාද මතයත්, 'සියල්ල ශුන්‍යය' යන මාධ්‍යමික මතයත් ඛණ්ඩනය වන බවයි. සියල්ල විඥාන නිර්මිතය යනුවෙන් දැක්වුනද සැබැවින්ම විඥානයක්ද නැති බැවින් 'ඇත' යන මතය බැහැර වන අතර බාහිර ලොව ඇතුළු සියල්ල මනසින් නිර්මිත බැවින් සියල්ල නැත යන ස්ථාවරයද බැහැර වේ. ඊට හේතුව නම් සියල්ල නැතැයි කී කල විඥාන පරිණාමයේ දැක්වෙන ආලය විඥානයද නැතය යනුවෙන් බැහැර කිරීමට සිදුවන බැවිනි. ආලය විඥානය යනු සියලු විඥානයන්ගේ බීජයයි. විකල්ප අනුව පරිණාමයට පැමිණෙන එය සත්‍යාවබෝධය වන තෙක් සසරේ ගමන් කරනු ලබයි.

'සර්වබීජං හි විඥානං - පරිණාමස් තථා තථා,

යාත්‍යන්‍යොන්‍යවශාද් යෙන - විකල්පඃ ස ස ජායතෙ'

සියල්ල මනසින් ගොඩනගා ගත් සිතිවිලි මාත්‍රයක් යැයි 'සර්වං බුද්ධිමයඃ' විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි දක්වනුයේ එබැවිනි.

එමෙන්ම මෙම ඉගැන්වීම්වලට එල්ල වුණු මතයන්ට ලබා දී ඇති පිළිතුරු හරහාද තව තවත් මෙම අදහස් ඉස්මතු කොට ගත හැක. බාහිර ලෝකය හුදෙක් චිත්තමාත්‍රතාවක් නම් දේශ වශයෙන්, කාල වශයෙන් එහි වෙනස්වීම් මෙන්ම බාහිර ලෝකය සියල්ලන්ට එක් අයුරකින් පෙනී යාමත්, බාහිර වස්තුවලට අනන්‍ය වූ විශේෂ වූ ක්‍රියාකාරීත්වත්ය පිළිබඳ සිදු කරන විග්‍රහයන් තුළින් තවදුරටත් සංකල්ප ලෝකය සම්බන්ධ කරුණු ඉස්මතු කොට ගත හැක. විංශතිකාකාරිකාවෙහි මේ සඳහා පිළිතුරු සපයනුයේ බාහිර ලෝකය සිහින ලෝකයකට සමාන කොටය.

'දෙශාදිනියමඃ සිද්ධඃ - ස්වප්නවත් ප්‍රෙතවත් පුනඃ

සන්තානානියමඃ සර්වෙඃ - පූයනද්‍යාදි දර්ශනෙ'

බාහිර දේශ කාල නියමය සිහිනයක් මෙනි. ඒවා වස්තුවක් නොමැතිවම සාධාරණ ලෙස සියල්ලන්ටම සිදු වන්නේ ප්‍රේත ලෝකයෙහි සිටින ප්‍රේතයන්ට සිදුවන්නාක් මෙනි. පූර්වකෘත කර්මානුකූලව සියලු ප්‍රේතයන් සැරව පිරුණු ගංගා ආදිය දකින්නේ කෙලෙස ද ඒ අයුරින් ය. ඒ අනුව පෘථග්ජනයින්ට බාහිර ලෝකය සත්‍යයක් වුවද සැබැවින්ම එය සිහිනයකි. සිහිනයට ද දේශ, කාල නියමයක් තිබේ. එය එක් එක් තැනැත්තාට වෙන් වෙන් අයුරින් ආවේණිකව සිදුවන්නකි. ස්ත්‍රිය හා පුරුෂයා සිහිනයේදී ද ඒ අයුරින්ම පෙනේ. ස්වප්න මෝචනය මීට උදාහරණ වශයෙන් දක්වා ඇත. *''ස්වප්නොපඝාතවත් කෘත්‍ය - ක්‍රියා නරකවත් පුනඃ''* සිහිනය එබඳු වුව ද එය සත්‍යයක් නොවේ. අවදි වූ විට දී එය මායාවක් බව වැටහේ. ඇසට පෙනෙන දෑ සැබවින්ම පවතී යැයි වටහා

ගණුයේ ඔවුන් සිහින ලොවක සිටින බැවිනි. මෙමගින් ද ගම්‍ය වනුයේ විඥානවාදී ඉගැන්වීම්වලින් මනසක් පමණක් ඇත යන අදහසක් නොව සියල්ල මනසින් නිර්මිතය යන සංකල්පය ඉදිරිපත් කරන බවයි. මේ පිළිබඳව තවදුරටත් විවරණය කර බැලීමෙන් ඒ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිය. ස්කන්ධ, ආයතන, ධාතු විභාගය තුළින් භාග්‍යවතුන් වහන්සේ සත්ත්ව පුද්ගල ස්වභාවයේ පවතින අසාරත්වය දක්වා ඇත. අභිධර්ම පිටකයේ විභංගප්‍රකරණය තුළ එනම් ඛන්ධ විභංග, ධාතු විභංග, ආයතන විභංග ආදිය මීට නිදසුන්ය. මෙකී කරුණු මත පදනම්ව ද විඥප්තිමාත්‍රතාව තම අදහස් ඉදිරිපත් කරනු ලබයි.

'රූපද්‍යායතනාස්තිත්වං - තද් විනෙයජනම් ප්‍රති,

අභිප්‍රායවශාදුක්ත - මුපපාදුකසත්වවත්'

රූපාදී ආයතනයන්ගේ ඇති බව විනේය ජනයා උදෙසා විශේෂ අදහසකින් දේශනා කරන ලද්දකි. නමුත් පුද්ගලයා නැත ස්කන්ධ, ධාතු, ආයතන ඇත යන්නත් එතුළින් ඉස්මතු නොකරන බව වසුබන්ධු තෙරුන්ගේ අදහසයි. ඒවාද සත්‍ය වශයෙන් නැත්තේය. ඊට හේතුව නම් ඒවාද චිත්‍රමාත්‍රතා පමණක් වීමයි. ලෝකයේ පවතින කුඩාම ඒකකය වන්නේ පරමාණුව බව පිළිගැනීමයි. නිකායාන්තර බුදු සමයේද මේ පිළිබඳ අදහස් දක්වා ඇත. ථෙරවාද අභිධර්මය තුළ පරමාණුවටත් වඩා කුඩාම දෙය ලෙස දක්වනුයේ රූප කලාපයයි. රූප කලාපයක් පරමාණුවටත් වඩා ඉතා කුඩා වූවක් ලෙස අභිධර්ම ග්‍රන්ථවල දැක්වේ. කෙසේ නමුත් ලෝකයේ පැවැත්ම දැක්වීමට බෞද්ධ නිකායන් පරමාණුවාදය ඉදිරිපත් කොට තිබේ. යෝගාචාර සම්ප්‍රදාය මෙය ද ප්‍රතික්ෂේප කරනු ලබනුයේ පරමාණුව ද චිත්තමාත්‍රතාවක් බව සඳහන් කරමිනි. භෞතික වශයෙන් ගත හැකි කිසිවක් බාහිර ලෝකයේ විද්‍යාමාන නොවේ. පරමාණුවාදයත් හුදෙක් සිතින් මවාගැනීමක් පමණකි, යන්න ඔවුනගේ ඉගැන්වීමයි.

ඉහත කරුණු මගින් සියල්ල විඥප්තිමාත්‍රතාවකි යන අදහස ඉස්මතු වන අතර එසේ විඥානයෙහි ස්වභාවය කෙබඳු දැ'යි විමසා බලා මනස පමණක් ඇත්තේදැ'යි යන කාරණාව තවදුරටත් පහදා ගැනීම අධ්‍යයනයට පහසුවකි. විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි ත්‍රිංශතිකා කාරිකාව තුළින්ද චිත්තමාත්‍රතාව පිළිබඳ ඉගැන්වීම් මගින් අදාළ ප්‍රස්තුතයට අවශ්‍ය කරුණු ඉස්මතු කොට ගත හැක. විඥානයේ පරිණාමය සිදු වන්නේ කෙසේද යන්න පිළිබඳව මෙහි කරුණු දක්වා ඇත. යෝගාචාරීන්ගේ මතය නම් විඥානය 'සත්' විඥෙය්‍ය 'අසත් ' යනුවෙනි. නමුත් විඥානය 'සත්' වශයෙන් ගත් කල එය ආත්ම දෘෂ්ටියක් කරා ගමන් කිරීමකි. බුදු දහම වනාහි ආත්මවාදය ප්‍රතික්ෂේප කොට අනාත්මය ඉස්මතු කරන හේතුඵල දහමකි. එම නිසා එකී තත්ත්වය මගහරවා ගැනීමට යෝගාචාරීන් විසින් ආලය විඥානය පිළිබඳව විග්‍රහය ඉදිරිපත් කොට ඇත. ආලය විඥානය වනාහි ත්‍රිවිධ විඥාන පරිණාමයන්හි සියලු කෙලෙසුන්ගේ බීජය වූ විපාක පරිණාමයයි. *''තත්‍රාලයාඛ්‍යං විඥානං - විපාකඃ සර්වබීජකම්''*

ලෝකයෙහි තිබෙන්නාවූ ආත්ම සහ ධර්ම වශයෙන් ගැනෙන සියල්ල ආලය විඥානයෙන් නිර්මිත ඒවාය. මෙම ආලය විඥානය වනාහී සම්මුතියක් ද නොව. පරමාර්ථයක් ද නොව. එය උපේක්ෂා සහගත වේදනාව වේ. එමෙන්ම එය අනිවෘත සහ අව්‍යාකෘතද වේ. තවද ස්පර්ශ, විදීම් ආදියෙන්ද යුක්ත වන බැවින් සැඩ පහරක් සේ

ගලායන්නකි. ත්‍රිංශතිකා කාරිකාවෙහි එය දැක්වෙනුයේ,

'උපෙක්ෂා වෙදනා තත්‍රා - නිවෘතාව්‍යාකෘතං ච තත්,

තථා ස්පර්ශදයස් තච්ච - වර්තතෙ ස්‍රොතසෞසවත් '

මෙකී ආලය විඥානයෙහි නැවැත්ම අරහත්වයේදී පමණක් සිදුවන්නකි. ආලය විඥානය වනාහි ථෙරවාද අභිධර්මයේ දැක්වෙන භවංග චිත්තය හා සමාන කළ හැකිය. රූපාදී ආරම්මණයන්ගෙන්ද කාමාදී ආශ්‍රවයන්ගෙන්ද වියුක්ත වූ භවංග චිත්තය භවය ඉදිරියට පවත්වාගෙන යනු ලබයි. ආලය විඥානය ඇසුරු කොටගෙන යම් විඥානයක් පවතී ද එය මනස නම් වේ. මුල් බුදු සමයේ 'මනෝ' ලෙසත්, ථෙරවාද අභිධර්මයේ 'වීථි චිත්ත, සවිකල්පික චිත්ත' ලෙසද දක්වනුයේ මෙයයි. ආලය විඥානය තුළම පවතින මෙම මනස් නම් විඥානය ආත්ම දෘෂ්ටි, ආත්ම මෝහ, ආත්ම ස්නේහ, ආත්ම මාන යන කෙලෙසුන්ගෙන් යුක්තය. මුල් බුදු සමයට අනුව නම් ප්‍රභාෂ්වර චිත්තය කිලිටි වනුයේ මනසට පැමිණෙන බාහිර ආගන්තුක උපක්ලේශයන් හේතුවෙනි. මෙලෙස තුලනාත්මක විග්‍රහයක් සිදුකරනු ලැබුවේ යෝගාචාර ඉගැන්වීම කුමක්දැ'යි වැඩිදුරටත් ඉස්මතු කිරීම සඳහාය.

රහතන් වහන්සේටත්, නිරෝධ සමාපත්තියට සමවැදුණු තැනැත්තාටත්, ලෝකෝත්තර මාර්ගයෙහිත් කිලිටි මනස නැත්තේය. ''*න නිරොධසමාපත්තෞ - මාර්ගෙ ලෝකොත්තරෙනච*'' එමෙන්ම සප්තම විඥානය ලෙසද දැක්වෙනුයේ මෙම විඥානයයි. ත්‍රිංශතිකා කාරිකාවෙහි දැක්වෙන විඥානය පරිණාමයේ දෙවැන්න මෙය වන අතර තුන්වැනි අවස්ථාව ප්‍රවෘත්ති විඥානය යන නාමයෙන් හැඳින්වේ. චක්ෂුර්, ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය සහ මනස් යනුවෙන් එය සයවැදෑරුම්ය. ආදි බෞද්ධ ඉගැන්වීම්වල ෂ විඥානකාය ආදි වශයෙන් බොහෝ සූත්‍රවල දැක්වෙනුයේ මෙය යැයි සැලකිය හැක. 'ප්‍රවෘත්ති' යන්න යෝගාචාරීන් මේ සඳහා යොදන නාමය වන අතර ඉන්ද්‍රියන් මගින් ලබා ගන්නා අරමුණු ප්‍රවෘත්ති ලෙස සලකා ඇත. ප්‍රවෘත්ති විඥානය විඥප්තිමාත්‍රතාව පිළිබඳව නිවැරදි දැනුම ආවරණය කරමින් පුද්ගලයා වෙත තොරතුරු සපයයි. එබැවින් මිනිසාගේ පැවැත්ම, මනස දූෂිත කරන්නා වූ විඥාන පරිණාමය මෙය බැවින් මේ සඳහා වැඩි අවධානයක් ද ලබා දී ඇත. මෙය කුසල, අකුසල සහ උපේක්ෂා ලෙස තෙවැදෑරුම්ය. එමෙන්ම විශාල චෛතසික ප්‍රමාණයක්ද ප්‍රවෘත්ති විඥානය සමඟ සම්බන්ධ වන බවත් ත්‍රිංශතිකාකාරිකාවෙහි දක්වා ඇත. එහි එන 09 වැනි ශ්ලෝකයේ සිට 14 වැනි ශ්ලෝකය දක්වා ඒ පිළිබඳ විග්‍රහ වේ. මෙමගින් පැහැදිලි වනුයේ බාහිර ලෝකය විඥප්තියක් මෙන්ම අසත් ලෙසත් දැක් වූ යෝගාචාරීන් විඥාන පරිණාමය හරහා විඥානයේ විපරිණාම ස්වභාවයත්, අස්ථිත්වයක් නොපවතින බවත් ඉස්මතු කර ඇති බවයි. සියලු දේ විඥප්තිමාත්‍රයක් නම් විඥානයේ ත්‍රිවිධ පරිණාමයක් දැක්වෙන්නේ කෙසේද යන ගැටලුවට ද ත්‍රිංශතිකා කාරිකාව කරුණු දක්වයි. අරමුණු පිළිබඳ පුද්ගලයාගේ අත්දැකීම් ත්‍රිවිධාකාර වීම එයට හේතුව වන අතර මෙම විඥානපරිණාමය ද ආත්ම ස්කන්ධාදී වශයෙන් වැරදි ලෙස සලකනු ලැබේ ද ඒ සියල්ලත් විඥප්තිමාත්‍රයන්ය. මන්දයත් ආත්මාදී වශයෙන් එහි කිසිවක් නොමැත්තේය.

'විඥානපරිණාමොයං - විකල්පො යද් විකල්ප්‍යතෙ,

තෙන තන්නාස්ති තෙනෙදං - සර්වං විඥප්තිමාත්‍රකම්.'

පුද්ගලයාගේ ඉන්ද්‍රිය මගින් බාහිර ලෝකය ගැන ලබන අරමුණු පරිකල්පිත යනුවෙන් හඳුන්වයි. සත්‍ය අවබෝධ නොකළ සත්ත්වයන් සිතින් මවාගනු ලබන සංකල්පනාවන් පරිකල්පිත ස්වභාවය නම් වේ. පුද්ගලයා තමන්ට අභිමත පරිදි ලෝකය හඳුනාගනු ලබයි. ''*යෙන යෙන විකල්පෙන - යද් යද් වස්තු ප්‍රකල්ප්‍යතෙ*'' එලෙස හඳුනාගන්නා දෙය සැබවින්ම ලොවෙහි විද්‍යාමාන ද නොවන්නකි. ''*පරිකල්විත එවාසෞ - ස්වභාවො න ස විද්‍යතෙ*'' මේ සියල්ල වනාහී සිතින් මවා ගන්නා ලද ස්වභාවයකි. නමුත් සියල්ලම විඥප්තිමාත්‍රයැයි ශ්‍රැතිමාත්‍රයෙන් පමණක් දැනගත නොහැකිය. එබැවින් ලෝක ව්‍යවහාරයක් නොමැති නිසාත්, නිර්විකල්පික ස්වභාවයෙන් යුක්ත නිසාත් මේ පිළිබඳ අවබෝධය ලෝකෝත්තර බව විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි දක්වා තිබේ.

ඒ අනුව බාහිර ලෝකය චිත්ත මාත්‍රයක් හෙවත් මනස තුළ උපදවා ගත් සංකල්පයක් වන බැවින් සත්‍ය වූත්, පරමාර්ථ වූත් බාහිර ලොවක්ද නැති බව මෙමගින් පැහැදිලි වන අතරම 'සත්' වූ විඥානයේ පරිණාමය හරහාද එය දිය පහරක් සේ වෙනස් වෙමින් සසර තුළ ගලායන්නක් බවද පැහැදිලිය. එමෙන්ම අරහත්වය, නිරෝධ සමාපත්තිය සහ සම්බුද්ධත්වයට පත් වූ විට නිමාවන්නා වූ ගමනක් විඥානයට ඇති බැවින් එයද සත්‍ය වශයෙන් පවතින්නක්ද නොවේ.

**සමාලෝචනය**

විඥානය සත්, විඥෙය්‍ය අසත් යනුවෙන් යෝගාචාරීන් තම ඉගැන්වීම් උද්දීපනය කරන ලද්දේ විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය මූලිකත්වයෙනි. පුද්ගලයා සහිත ආනුභවික ලෝකයත්, පරමාර්ථ ධර්ම පිළිබඳවත් බෞද්ධ සම්ප්‍රදායන් අතර මෙන්ම අන්‍ය භාරතීය දර්ශනයන් තුළද විවිධ මතිමතාන්තර පැවති සමයක විඥානවාදී සම්ප්‍රදාය තම ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇත. පුද්ගල මනසට ගෝචර වන බාහිර ලෝකය හුදෙක් සත්‍ය වශයෙන්ම නොපවතින මායාවක් බඳු සංකල්පයක් යැයි ඔවුන්ගේ විග්‍රහයයි. විංශතිකා කාරිකාවෙහි ශ්ලෝක වැඩි ප්‍රමාණයක්ම එයට සාක්ෂ්‍ය දරයි. එමෙන්ම විඥානය සත් යනුවෙන් දැක්වුවද ත්‍රිවිධ විඥාන පරිණාමය පිළිබඳ ඉගැන්වීම් මගින් ආත්ම දෘෂ්ටියකට නොවැටී විඥානයේද උදයව්‍යය ක්‍රියාකාරීත්වය ත්‍රිංශතිකාරිකාවෙහි දක්වයි. යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායේ මනස පිළිබඳ ඉගැන්වීම මෙයාකාරය. සමස්ත විග්‍රහය ගෙන බැලූවිට පැහැදිලි වනුයේ යෝගාචාර චින්තනයේ මූලික ඉගැන්වීම් මගින් 'මනසක් පමණක් ඇත' යන කිසිදු විවරණයක් ඉස්මතු නොවන බවයි. විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි එන විංශතිකා හා ත්‍රිංශතිකා කාරිකා ඊට නිදසුන් ලෙස දැක්විය හැක. යමෙකු එලෙස විග්‍රහ කරනුයේ නම් එය විඥානවාදී ගුරුකුලයේ ඉගැන්වීම් සමග නොගැළපෙන අදහසකි. මාතෘකානුකූලව සිදුකරන ලද අධ්‍යයනයට අනුව මනසක් පමණක් ඇත යන අදහසක් යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායේ ඉගැන්වීම් මගින් ගම්‍ය නොවන බව අවසාන වශයෙන් මෙහිදී දැක්විය හැක.

**ප්‍රමුඛ පද** - යෝගාචාර, මනස, විඥානවාදය, සම්ප්‍රදාය, විඥප්තිමාත්‍රතාසිද්ධි

## ආශ්‍රිත ග්‍රන්ථ

ඤාණසීහ හිමි, හේන්පිටගෙදර. (1964). *විඥප්තිමාත්‍රතාසිද්ධි වාදය.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

තිලකරත්න, අසංග. (2012). *අභිධර්ම අධ්‍යයන.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයො.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2003). *බෞද්ධ විඥානවාදය විඥප්තිමාත්‍රතාසිද්ධිය ඇසුරින්.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයො.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2016). *මහාචාර්ය බලදේව උපාධ්‍යායයන්ගේ බෞද්ධ දර්ශනය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයො.

විමලඤාණ හිමි, නාඹටුන්නේ. (2018). *යෝගාචාර බුදුසමය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.